# යුරෝපා ඉතිහාසය

## 5.1.5 කාර්මික විප්ලවයේ වයාප්තිය



## කාර්මික විප්ලවයේ මුල් කාලීන ව්‍යාප්තිය




Cop.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ජී.ජී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

කාර්මික විප්ලවය මුලින් ම ඇතිවුයේ බ්‍රිතාන්‍යයේ ය. පසුව යුරෝපා මහද්වීපය පුරා ද සෙසු මහද්වීපවලට ද කාර්මික විප්ලවය ව්‍යාප්ත විය. මෙසේ කාර්මික විප්ලවය ලොව පුර ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන හේතු කීපයක් හඳුනා ගත හැකි ය.

- ලොව පුරා ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වීම නිසා ඉල්ලුම වැඩි වීම.
- යුරෝපය පුරා ප්‍රවාහන කටයුතු වර්ධනය වීම.
- ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම.

බ්‍රිතාන්‍ය තුළ කාර්මික විප්ලවය ව්‍යාප්ත වන සමයේ ම ප්‍රංශයට ද බලපෑම් ඇති වුවත් නැපෝලියන්ගේ බලපෑම මත එය සාර්ථක වුයේ නැත. නැපෝලියන්ගේ පරාජයෙන් පසු කාර්මික විප්ලවය යුරෝපය පුරා ව්‍යාප්ත විය. 19 වන සියවස මැද භාගය වන විට ජර්මනිය කාර්මික ක්ෂේත්‍රය ශීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගැනීමට සමත් විය. ඊට පසු කාලයක යුරෝපයේ බොහෝ රටවල්වලට කාර්මික විප්ලවය පැතිරී ගිය අතර එම රටවල් ද ශීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගන්නා ලදී. ප්‍රංශය, බෙල්ජියම ,ඔස්ට්‍රියාව , ඉතාලිය, හංගේරියාව ආදී රටවල් ප්‍රධාන විය.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වූ ඇමරිකන් ජනපදවලටද කාර්මික විප්ලවය පැතුරුණි. නිදහස දිනා ගැනීමෙන් පසු ඇමරිකා එක්සත් ජනපදය කාර්මික ක්ෂේත්‍ර ශීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගත්තේ ය.

19 සියවස අගභාගය හා 20 වන සියවස මුල් කාලයේ දී ආසියාතික රටක් වූ ජපානය කාර්මික ක්ෂේත්‍රයේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගැනීම දක්නට ලැබුණි. 20 වන සියවස වන විට සෙසු ආසියාතික රටවල් කරා ද කාර්මික විප්ලවය ව්‍යාප්ත විය. චීනය , ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල් ද ඒ අතර ප්‍රධාන විය.

ජපානය මුල දී බටහිර සභ්‍යත්වය තම රට තුළට ඇතුළත්වීමට විරුද්ධත්වය දැක්වී ය. කොමදෝරු පෙරීගේ ජපන් ආගමනයෙන් ඔවුන් අවබෝධ කර ගත් දෙයක් වූයේ, බටහිර රටවල් දිනාගෙන ඇති ජයග්‍රහණවල රහස ඔවුන්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතිය තුළ බවයි. එහෙයින් බටහිර රටවල ක්‍රම ආදර්ශයට ගැනීමට ජපානය පුරුදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ආසියානු රටක් වූ ජපානය කාර්මික ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් අත්පත් කරගැනීමට සමත් විය. වර්තමානයේ පවා ලෝකයේ බලවත් රටවල් අතරට එක්වීමට ජපානයට හැකිව ඇත්තේ මේ නිසා ය.

ඉන්දියාව ද වර්තමානයේ ආසියානු රටක් ලෙස කාර්මික ක්ෂේත්‍රයේ ඉදිරියට ම පැමිණි රටකි. බ්‍රිතානයේ යටත් විජිතයක් ලෙස සිටි සමයේ ඩැල්හවුසිසාමිගේ පාලන කාලයේ දී ඉන්දියාවේ කාර්මික ක්ෂේත්‍රයේ ප්‍රගතිය ආරම්භ විය. දුම්රිය හා විදුලි පණිවිඩ ක්‍රම ඉන්දියාවට හඳුන්වා දුන් අතර බ්‍රිතාන්‍ය මූල ධනයෝජනය සඳහා ඉදිරිපත් විය. ඉංග්‍රීසි ජාතික ව්‍යවසායකයන් ද ඉන්දියාවේ කාර්මික ක්ෂේත්‍රයේ මුදල් ආයෝජනයට ඉදිරිපත් විය.

අන්තර්ගතය :- එච්.පී.අයි.කුමාරි මිය,ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- පී.පී. තිලිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පසු කාලීනව කාර්මික විප්ලවය පැතිරී ගිය රටවල්




Copyright ©

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,ගුරු උපදේශිකා - දෙනුවර අධ්‍යාපන කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ජී.ජී. තිළිණි නිමේෂා මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk